# ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය

මාධ්‍යය නිවේදනය

07-06-2021 කොළඹ

කොවිඩ් 19: ස්විට්සර්ලන්තය ශ්‍රී ලංකාවට මානුෂීය ආධාර ලබාදෙයි

කොවිඩ් 19 වසංගතයට එරෙහි සටනේදී ස්විට්සර්ලන්තය ශ්‍රී ලංකාවට සිය සහයෝගය පලකරයි. 2021 ජුනි 8 වෙනි දින උදයේ ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල මිලියන භාගයකට අධික ප්‍රමාණයක් සහ ශ්වසන යන්ත්‍ර 50ක් ද ඔක්සිජන් සාන්ද්‍රක 150 ක් සහ රුපියල් මිලියන 800ක් වටිනා වෛද්‍ය උපකරණ කොළඹට ලඟා වෙමින් ඇත. මෙම ආධාර රටපුරා සිටින ජනතාවට ප්‍රයෝජනවත් වන අතර දෙරට අතර මිත්‍රත්වය සහ දීර්ඝකාලීන සහයෝගයේ ද සළකුණකි.

ශ්‍රී ලංකාවේ බරපතල සෞඛ්‍ය තත්වය සහ ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් කරන ලද ඉල්ලීම ද සැලකිල්ලට ගනිමින් ස්විස් ඒඩ් වැඩ පිලිවෙල ස්විස්ටර්ලන්ත තානාපති කාර්යාලය ද ඇතුලත්ව අර්බුද උපදේශක කමිටුවක් ස්ථාපනය කර ශ්‍රී ලංකාව ගෙන යන සටනට අවශ්‍ය සහාය ලබාදීමට ලංකාවෙන් වාර්තාවුනු අවශ්‍යයතාවයන් ද සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය අංශයට ස්විට්සර්ලන්තයෙන් ලබාදිය හැකි මානුෂීය ආධාර ලැයිස්තුවක් සකස් කරන ලදි.

ජුනි මස 8 වෙනි දින අඟහරුවාදා උදසන ටොන් 16 ක ද්‍රව්‍ය රැගත් යානයක් සූරිච් සිට කොළඹට ගොඩබසිනු ඇත. ආධාර නැව්ගත කිරීම සඳහා ස්විට්සර්ලන්ත හමුදාවේ බෙහෙත් සැපයුම් අංශය විසින් සපයන ලද ශ්වසන යන්ත්‍ර 50ක් ඔක්සිජන් සාන්ද්‍රක 150ක් සහ වෙනත් වෛද්‍යය සැපයුම් ද ඔක්සිජන් ධාරිතාවය මැනීමට අවශ්‍ය උපකරණ ද මීට ඇතුලත්ය. මීට අමතරව ස්විට්සර්ලන්තයේ සෞඛ්‍යය ආමාත්‍යාංශය විසින් ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල මිලියන භාගයකට අධික ප්‍රමාණයක්ද ලබා දෙනු ඇත.

මෙම ආධාර සෞඛ්‍ය ආමාත්‍යංශය වෙත ලබා දෙන අතර අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ලැබී ඇති තොරතුරු අනුව විවිධ ප්‍රදේශවලට එක සමාන ලෙස බෙදා හැරීමේ මූලධර්මයන්ට අනුව මෙම ආධාර සපයනු ඇත

පසුගිය වසරේද කොවිඩ් 19ට එරෙහි සටනේදී ස්විටසර්ලන්තය දැනටමත් ශ්‍රී ලංකාවට සහයෝගය ලබාදී ඇති අතර එය ඩොලර් මිලියන 220ක් පමණ වේ. 2020 ඔක්තෝබර් මාසයේදී ස්විට්සර්ලන්තය කොළඹ ගුවන්තොටුපල සඳහා පීසීආර් යන්ත්‍රයක් ද පරීක්ෂණ කට්ටල 39000 ක් ද ඇතුලුව පහසුකම් ලබා දී ඇත. මෙම දායකත්වයේ පරමාර්ථය වූයේ ශ්‍රී ලාංකිකයන් නැවත ගෙන්වා ගැනීමටත් කොඩ්ඩ් 19 නිසා විදේශ රැකියා අහිමි වූ ශ්‍රී ලාංකික සංක්‍රමිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට සහාය වීමයි. එසේම ඩොලර් මිලියන 22ක් ස්විට්සර්ලන්ත තානාපති කාර්යලය දිළිඳු සහ විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල් සඳහා කොවිඩ් හදිසි ආධාර සැපයීමට දේශීය සංවිධාන වෙත ලබාදී ඇත.

අද දින ලබාදෙන මෙම ආධාරය දකුනු ආසියාවට තුන්වෙනි වරට සිදු කරන නැව්ගත කිරීමය. ඉදිරි සතිවලදී ස්විස් එඩ් ආධාර යටතේ දැනටමත් ඉන්දියාවට ටොන් 13ක් සහ නේපාලයට ටොන් 30ක ආධාර යවා ඇත. කොවිඩ් 19 වසංගතය හමුවේ ස්විට්සර්ලන්ත මානුෂීය ආධාර ලෝකයේ සෞඛ්‍ය තත්වය නිරන්තරයෙන් අධීක්ෂණය කරමින් සිටින අතර හැකිතාක් දුරට සහ ඉල්ලීම් ප්‍රකාරව ආධාර ලබාදීමට සූදානමිය.

**විමසීම්** සඳහා: colombo@eda.admin.ch